OL/2021(2022)/11/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

128493

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

11 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

**බුද්ධ ධර්මය I, II**
பௌத்தம் I, II
Buddhism I, II

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## බුද්ධ ධර්මය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** සිදුහත් බෝසතාණන් වහන්සේ දේවාරාධනය ලැබීමෙන් පසු තම අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලීම හඳුන්වනුයේ,
(1) සමතිස් පෙරුම් පිරීම නමිනි. (2) පංච මහා විලෝකනය නමිනි.
(3) පංච මහා ස්වප්න (සිහින) දැකීම නමිනි. (4) චතුරංග සමන්නාගත වීර්ය වැඩීම නමිනි.

**2.** තරුණ සිදුහත් කුමාරයාට ජීවිතයේ සැබෑ යථාර්ථය අවබෝධ වූයේ,
(1) නිබ්බුත පද ඇසීමෙනි. (2) මාර දූවරුන්ගේ රංගනය දැකීමෙනි.
(3) සතර පෙර නිමිති දැකීමෙනි. (4) නළඟනන්ගේ විප්‍රකාර දැකීමෙනි.

**3.** යසෝදරා දේවියට පුතකු ලද බව පණිවුඩකරුවකු මගින් අසන්නට ලැබුණු විට සිදුහත් බෝසතුන්ගේ මුවින් "රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං" යනුවෙන් ප්‍රකාශ වූයේ,
(1) තම දේවියට පුතකු උපන් බව ඇසීම සතුට ගෙනදෙන්නක් වූ බැවිනි.
(2) රාහුල කුමාරයාට අනාගතයේ බන්ධන ඇතිවන බැවිනි.
(3) උපන් කුමාරයාට රාහුල යන නම තැබිය යුතු වූ බැවිනි.
(4) ගිහිගෙයින් නික්ම පැවිදිවීමට බාධාවක් වන බැවිනි.

**4.** "අනුන් මාගේ, ධර්මයේ හෝ සංඝයාගේ අගුණ හෝ ගුණ කියතොත් ඉන් අසතුටට හෝ ප්‍රීතියට පත් නොවිය යුතු ය." බුදුරජාණන් වහන්සේ මෙලෙස දේශනා කළේ එක්තරා පරිබ්‍රාජකයකුගේ හා ඔහුගේ අන්තේවාසිකයාගේ කතාබහක් නිසා ය. ඒ දෙදෙනාගේ නම් ඇතුළත් වරණය කුමක් ද?
(1) සුප්පිය හා සෝණදණ්ඩ (2) බ්‍රහ්මදත්ත හා සුප්‍රබුද්ධ
(3) සුප්පිය හා බ්‍රහ්මදත්ත (4) සුප්පිය හා තෝදෙය්‍ය

**5.** බුදුරජාණන් වහන්සේ නිශ්ශබ්දතාව අගය කරන බවත්, තම අසපුවට උන්වහන්සේ වඩින නිසා නිශ්ශබ්දතාව ආරක්ෂා කරන ලෙසත් තම සිසුනට දන්වනු ලැබුයේ,
(1) උපක ආජීවකයා විසිනි. (2) සංජය පිරිවැජියා විසිනි.
(3) චංකී බ්‍රාහ්මණයා විසිනි. (4) පොට්ඨපාද පිරිවැජියා විසිනි.

**6.** සිද්ධාර්ථ කුමාරයාගේ උත්පත්තිය හා බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණය සිදු වූ ස්ථාන දැක්වෙන වරණය කුමක් ද?
(1) නිග්‍රෝධ උයන හා කලන්දක නිවාප (2) ලුම්බිණි සල් උයන හා උපවත්තන සල් උයන
(3) ජීවක අඹ උයන හා සප්තපර්ණි ගුහාව (4) ලුම්බිණි සල් උයන හා ඉසිපතන මිගදාය

[දෙවැනි පිටුව බලන්න.

**7.** බුදුරජාණන් වහන්සේ පාරිලෙය්‍ය වනයෙහි වැඩ වසමින් වඳුරකුගේ හා ඇතකුගේ උවටැන් ලබමින් ගත කළේ කිනම් වස්කාලය ද?
(1) පස්වන වස්කාලයයි. (2) නයවන වස්කාලයයි.
(3) අටවන වස්කාලයයි. (4) දහවන වස්කාලයයි.

**8.** බුදුරජාණන් වහන්සේගේ වර්ණනාවට භාජනය වූ උදේන, ගෝතමක, සත්තම්බක, සාරන්දද ආදී රමණීය චෛත්‍ය ස්ථාන පිහිටියේ,
(1) විශාලා මහනුවරයි. (2) රජගහ නුවරයි. (3) කිඹුල්වත් නුවරයි. (4) උදේනි නුවරයි.

**9.** සුදත්ත හෙවත් අනේපිඬු සිටුතුමාට බුදුරජාණන් වහන්සේ පළමුවරට මුණ ගැසුනේ උන්වහන්සේ,
(1) ඉසිපතන මිගදායේ වැඩසිටියදී ය. (2) අනෝමා නදී තීරයේ අනුපිය අඹ වනයේ වැඩසිටියදී ය.
(3) රජගහනුවර සීත වනයේ වැඩසිටියදී ය. (4) විශාලා මහනුවර කූටාගාර ශාලාවේ වැඩසිටියදී ය.

**10.** පුද්ගලයාට වැළඳෙන විවිධාකාර රෝගාබාධ හා ඒ සඳහා හේතුවන කරුණු පිළිබඳ පෙන්වාදෙමින් දේශනා කළ සූත්‍ර ධර්මය වන්නේ,
(1) ඉසිගිලි සූත්‍රයයි. (2) ගිරිමානන්ද සූත්‍රයයි.
(3) චුන්ද සූත්‍රයයි. (4) මහාසමය සූත්‍රයයි.

**11.** බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය පරිදි, බඹරා මල නොතලා රොන් ගන්නාක් මෙන් භික්ෂූන් වහන්සේ ද සමාජයට බරක් නොවන ආකාරයෙන් සැදැහැවතුන්ගෙන්,
(1) පින් ලබාගත යුතු ය. (2) සිව්පසය ලබාගත යුතු ය.
(3) ගරු සම්මාන ලබාගත යුතු ය. (4) මිල මුදල් ලබාගත යුතු ය.

**12.** සම්මා සම්බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝධිසත්වයන් වහන්සේලා දස පාරමිතා තුන් ආකාරයකින් සම්පූර්ණ කිරීමෙන් පාරමිතා ධර්ම තිහක් බවට පත් වේ. එම තුන් ආකාරය,
(1) දාන, සීල, භාවනා නම් වේ. (2) සම්මා සම්බුද්ධ, පච්චෙක බුද්ධ, අරහන්ත බුද්ධ නම් වේ.
(3) සීල, සමාධි, ප්‍රඥා නම් වේ. (4) පාරමී, උපපාරමී, පරමත්ථ පාරමී නම් වේ.

**13.** තණ්හා මාන මිථ්‍යාදෘෂ්ටියෙන් තොරව, කරුණා ප්‍රඥාවෙන් යුතුව, කය වචන දෙකෙහි සංවර බව ඇතිකර ගනිමින් සම්පූර්ණ කරන පාරමිතාව හඳුන්වනුයේ,
(1) සීල පාරමිතාව නමිනි. (2) සච්ච පාරමිතාව නමිනි.
(3) ඛන්ති පාරමිතාව නමිනි. (4) නෙක්ඛම්ම පාරමිතාව නමිනි.

**14.** සිදුහත් බෝසතාණන් වහන්සේ උපේක්ෂා පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය ප්‍රකට වන ජාතක කථාව කුමක් ද?
(1) මසමානවක ජාතකය (2) ලෝමහංස ජාතකය
(3) උම්මග්ග ජාතකය (4) වට්ටක ජාතකය

**15.** ධර්ම රත්නයේ ගුණ අතර "තමා විසින්ම පිළිපැද, මෙලොවදීම ප්‍රතිඵල දැකගත හැකිවීමේ ගුණය" හැඳින්වෙන්නේ,
(1) සන්දිට්ඨික නමිනි. (2) අකාලික නමිනි. (3) ඒහිපස්සික නමිනි. (4) ඕපනයික නමිනි.

**16.** පටිච්ච සමුප්පාද න්‍යායට අනුව "හේතුං පටිච්ච සම්භූතං හේතු භංගා නිරුජ්ඣති" යන්නෙන් අදහස් කරන ලද්දේ,
(1) ඕනෑම දෙයක් ඇතිවීමට කිසියම් හේතුවක් බලපාන බවයි.
(2) හේතු සොයා බලා ඒවාට ප්‍රතිකර්ම කළ යුතු බවයි.
(3) හේතු නැතිවන විට, ඒ හේතු නිසා හටගත් ඵල ද නැතිව යන බවයි.
(4) හේතුවක් කරණකොට උපන් සියල්ල විනාශවන බවයි.

**17.** "මහණෙනි, දුප්පතුන්ට ධනය නූපදනා කළ දිළිඳුකම වැඩි වේ." යනාදී වශයෙන් හේතුඵල දහම අනුව සමාජ ගැටලු ඇතිවන ආකාරය පැහැදිලි කරමින් දේශනා කළ සූත්‍ර ධර්මය කුමක් ද?
(1) සාමඤ්ඤඵල සූත්‍රය (2) චක්කවත්ති සීහනාද සූත්‍රය
(3) බ්‍රහ්මජාල සූත්‍රය (4) කසී භාරද්වාජ සූත්‍රය

**18.** බෞද්ධ ඉගැන්වීම අනුව සත්ත්වයා හා ලෝකය යනු ස්කන්ධ ධර්ම පහක එකතුවකි. එම ස්කන්ධ ධර්ම පහ,
(1) රූප, වේදනා, සඤ්ඤා, චේතනා, විඤ්ඤාණ නම් වේ.
(2) රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ නම් වේ.
(3) රූප, වේදනා, තණ්හා, උපාදාන, භව නම් වේ.
(4) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ නම් වේ.

[තුන්වැනි පිටුව බලන්න.

**19.** පහත සඳහන් සූත්‍ර අතුරෙන් කුසලාකුසල කර්ම හා කර්ම විපාක පිළිබඳව මනාව විස්තර කර දෙන සූත්‍ර ධර්මය වන්නේ,
(1) අනත්ත ලක්ඛණ සූත්‍රයයි. (2) පරාභව සූත්‍රයයි.
(3) චූල්ල කම්මවිභංග සූත්‍රයයි. (4) මහා මංගල සූත්‍රයයි.

**20.** බුදුරජාණන් වහන්සේ තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයාට දේශනා කළ පරිදි, යමෙකු දුර්වර්ණව උපත ලැබීම සඳහා ඉවහල්වන ක්‍රියාව වන්නේ,
(1) ප්‍රාණඝාතයෙහි නිරත වීමයි. (2) ද්වේශයෙන් කටයුතු කිරීමයි.
(3) තමා සතු කිසිවක් අන් අයට නොදීමයි. (4) අන් සැපතට ඊර්ෂ්‍යා කිරීමයි.

**21.** "සිතින් ඇඩිව අල්ලා ගැනීම හේතුකොට ගෙන නැවත නැවත භවයට එකතු වේ" යන්න සඳහන් අනුලෝම පටිච්චසමුප්පාද පාඨය කුමක් ද?
(1) "සංඛාර පච්චයා විඤ්ඤාණං" (2) "ඵස්ස පච්චයා වේදනා"
(3) "උපාදාන පච්චයා භවො" (4) "භව පච්චයා ජාති"

**22.** පංච නීවරණ ධර්ම අතරට අයත් 'සිතෙහි නොසන්සුන්කම හා කළ නොකළ දේ පිළිබඳ සිතෙහි ඇතිවන පසුතැවිල්ල' හඳුන්වනු ලබන්නේ,
(1) ව්‍යාපාද නමිනි. (2) ථිනමිද්ධ නමිනි.
(3) උද්ධච්ච කුක්කුච්ච නමිනි. (4) විචිකිච්ඡා නමිනි.

**23.** යහපතට යෙදූ විට මව්පියන් කරන යහපතට වඩා යහපතක් සිදු කරන්නා වූත්, අයහපතට යෙදූ විට සතුරකු කරන අයහපතට වඩා අයහපතක් සිදු කරන්නා වූත් එකම සාධකය ලෙස බුදුදහමෙහි පෙන්වා දෙනු ලබන්නේ,
(1) සිතයි. (2) කයයි. (3) වචනයයි. (4) වේදනාවයි.

**24.** බුදුදහමෙහි විස්තර වන පංච බලි සංකල්පයෙහි එන 'පුබ්බපේත බලි' යන්නෙහි අර්ථය වන්නේ,
(1) ඥාතීන්ට සංග්‍රහ කිරීමයි. (2) ආගන්තුකයින්ට සංග්‍රහ කිරීමයි.
(3) මියගිය ඥාතීන්ට පින් දීමයි. (4) දෙවියන්ට පින් අනුමෝදන් කිරීමයි.

**25.** කරුණු නොදැන පදනමකින් තොරව ඇති කරගත් ශ්‍රද්ධාව, ධර්මයෙහි හඳුන්වනු ලබන්නේ,
(1) අමූලිකා සද්ධා නමිනි. (2) ආකාරවතී සද්ධා නමිනි.
(3) අචල සද්ධා නමිනි. (4) අවෙච්චප්පසාද සද්ධා නමිනි.

**26.** පුද්ගලයකුගේ ප්‍රතිසන්ධිය ලබාදීමට ඉවහල්වන කර්මය හඳුන්වනු ලබන්නේ,
(1) ජනක කර්ම නමිනි. (2) උපත්ථම්භක කර්ම නමිනි.
(3) උපපීඩක කර්ම නමිනි. (4) උපඝාතක කර්ම නමිනි.

**27.** බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව ප්‍රකාශ කළ ප්‍රථම උදාන වාක්‍යයෙන්, දුක් සහිත පංචස්කන්ධය නමැති ගෘහය නිර්මාණය කරන අදෘශ්‍යමාන බලවේගය ලෙස හඳුන්වා ඇත්තේ,
(1) අවිද්‍යාවයි. (2) වේදනාවයි. (3) තෘෂ්ණාවයි. (4) විඤ්ඤාණයයි.

**28.** ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට බෙදා දැක්වීමේදී සීලය යටතට අයත් මාර්ග අංග ඇතුළත් වරණය තෝරන්න.
(1) සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා
(2) සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම
(3) සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි
(4) සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව

**29.** බුදුරජාණන් වහන්සේ අනේපිඬු සිටුතුමාට දේශනා කළ 'පත්තකම්ම සූත්‍රයේ' ධනය හෙවත් භෝග සම්පත් මනාව පරිහරණය කිරීමට උපදෙස් ලබා දී ඇත. එහි දැක්වෙන කරුණු අතරට අයත් **නොවන** කරුණ කුමක් ද?
(1) ආත්මාර්ථය සඳහාම ධනය ඉපයිය යුතු ය.
(2) ධාර්මිකව උපයාගත් ධනය මනාව ආරක්ෂා කරගත යුතු ය.
(3) පංච බලි නම් යුතුකම් පහක් ඉටු කළ යුතු ය.
(4) මහණ බමුණන්ට සංග්‍රහ කිරීම සඳහා වැය කළ යුතු ය.

**30.** "අසවලා මට බැන්නේ ය. මට පහර දුන්නේ ය. මා පැරද වූයේ ය." යනාදී වශයෙන් වෛර බඳින්නාගේ වෛරය නොසන්සිඳෙන බව අවධාරණය කරමින් දේශනා කළ ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
(1) "තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති" යන්නයි.
(2) "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති" යන්නයි.
(3) "අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මේ" යන්නයි.
(4) "සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානි ච" යන්නයි.

**31.** පාලකයකු විවිධ අදහස් හා මතවාද දරන පිරිස් සමග මධ්‍යස්ථව හා ගැටුමකින් තොරව කටයුතු කිරීම දස රාජධර්මවල හැඳින්වෙන්නේ,
(1) මෘදු බව යනුවෙනි. (2) අක්‍රෝධය යනුවෙනි.
(3) ඉවසීම යනුවෙනි. (4) අවිරෝධතාව යනුවෙනි.

**32.** රාජ්‍ය පාලකයකු සම්බන්ධව සැලකීමේදී යුක්තිය-අයුක්තිය, හොඳ-නරක තෝරා බේරා ගැනීමට නොහැකිව මුලා වී අගතිගාමී වීම හඳුන්වන්නේ,
(1) ඡන්දය ලෙසයි. (2) ද්වේශය ලෙසයි.
(3) භය ලෙසයි. (4) මෝහය ලෙසයි.

**33.** අලුවිහාර සංගීතිය හෙවත් සිව්වන ථෙරවාදී සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු අතරට අයත් **නොවන** කරුණ කුමක් ද?
(1) වලගම්බා රාජ්‍ය සමයේ ඇති වූ බැමිණිතියා සාගතය නිසා භික්ෂූන්ට ප්‍රත්‍ය පහසුව නොලැබීම
(2) මහා විහාරීය භික්ෂූන් වහන්සේලාට රාජානුග්‍රහය නොමඳව ලැබීම
(3) දකුණු ඉන්දීය ආක්‍රමණිකයන්ගෙන් සිහසුනට එල්ල වූ බලපෑම
(4) ලක්දිව ඇතැම් භික්ෂූන් ශාසනික පිළිවෙත්වලින් ඈත් වීම

**34.** "ඇවැත්නි, ශෝක නොකරව්. නොවැලපෙව්. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මැනවින් මිදුණෝ වෙමු." යන ප්‍රකාශය කරනු ලැබූයේ,
(1) සුදින්න භික්ෂුව විසිනි. (2) දේවදත්ත භික්ෂුව විසිනි.
(3) ඡබ්බග්ගිය භික්ෂූන් විසිනි. (4) සුභද්‍ර භික්ෂුව විසිනි.

**35.** පළමු ධර්ම සංගායනාවෙන් පසු සසුනේ සුරක්ෂිත බව ඇති කරලීම සඳහා ධර්ම කොටස් මුඛ පරම්පරාගතව රැගෙන යාමට භාණක පරම්පරාවන්ට භාර කෙරුණි. ඒ අනුව දීඝ නිකාය භාර දෙනු ලැබුවේ,
(1) ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
(2) සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
(3) අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
(4) මහා කාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.

**36.** දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගණයට අයත් **නොවන** කරුණ කුමක් ද?
(1) දස වස්තුව අකැප බව තීරණය කිරීම
(2) අටළොස් නිකායක් දක්වා ශාසනය බෙදීයාමට මුලබීජ සැපයීම
(3) භික්ෂු පිරිස ස්ථවිරවාද හා මහාසාංඝික ලෙස බෙදීයාම
(4) විසිරී පැවති ධර්මය ඒකරාශී කොට නිකාය පහකට බෙදීම

**37.** ගර්භයේ හැඩය නෙල්ලි ගෙඩියක ස්වරූපයෙන් ගොඩනංවන ලද ස්තූප හැඳින්වෙන්නේ,
(1) ඝණ්ඨාකාර ස්තූප ලෙසයි. (2) ඝටාකාර ස්තූප ලෙසයි.
(3) පද්මාකාර ස්තූප ලෙසයි. (4) ආමලකාකාර ස්තූප ලෙසයි.

**38.** බෝධි වෘක්ෂයේ ආරක්ෂාවට නිමකර ඇති පියස්සක් සහිත මණ්ඩපය බෝධිඝරය ලෙස හඳුන්වන අතර දැනට කලාත්මක බවින් උසස් බෝධිඝරයක් හමුවී ඇත්තේ,
(1) වැල්ලවායේ බුදුරුවගලිනි. (2) පොළොන්නරුවේ ගල් විහාරයෙනි.
(3) කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගමිනි. (4) මාතලේ ආලෝක විහාරයෙනි.

**39.** ආබද්ධ හිටි පිළිමයක් සඳහා නිදසුනක් ලෙස දැක්විය හැක්කේ,
(1) අවුකන බුද්ධ ප්‍රතිමාවයි. (2) මාලිගාවිල බුද්ධ ප්‍රතිමාවයි.
(3) තොළුවිල සමාධි බුද්ධ ප්‍රතිමාවයි. (4) තන්තිරිමලේ බුද්ධ ප්‍රතිමාවයි.

**40.** පාලි භාෂාව නොදත් සාමාන්‍ය ජනතාවට උපදේශ සැපයීම සඳහා වීදාගම මෛත්‍රී හිමියන් විසින් රචිත කවි බණපොත කුමක් ද?
(1) කාව්‍යශේඛරය (2) ලෝවැඩ සඟරාව
(3) ලෝකෝපකාරය (4) සුභාෂිතය

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**11 S I, II**

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
# கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021 (2022)
# General Certificate of Education (Ord. Level) Examination, 2021 (2022)

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

## බුද්ධ ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

1. (i) සිදුහත් කුමාරයාට කුඩා කළ ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඬිවරයාගේ නම කුමක් ද?
(ii) ධර්ම රත්නයේ ගුණ දැක්වෙන පාඨයේ සඳහන් 'සන්දිට්ඨිකො' යන්නෙහි අදහස ලියන්න.
(iii) "යාදිසං වපතේ බීජං තාදිසං හරතේ ඵලං" යන පාඨයේ අර්ථය ලියන්න.
(iv) උම්මග්ග ජාතකයෙන් ප්‍රකට වන්නේ, අප මහ බෝසතාණන් වහන්සේ කිනම් පාරමිතාවක් සම්පූර්ණ කළ ආකාරය ද?
(v) ත්‍රිපිටකය නම් කරන්න.
(vi) සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි දෙමාපියන් විසින් තම දූ දරුවන්ට ඉටුකළ යුතු යුතුකම් **දෙකක්** ලියන්න.
(vii) සතර අගතිය නම් කරන්න.
(viii) "සළායතන පච්චයා ඵස්සෝ" යන්නෙහි අර්ථය ලියන්න.
(ix) 'පූජාවලිය' රචනා කළ ගත් කතුවරයා සහ ඊට පාදක කරගෙන ඇති බුදුගුණය ලියා දක්වන්න.
(x) බුදුදහමේ දැක්වෙන නොකළ යුතු වෙළඳාම් **දෙකක්** ලියන්න.

2. (i) බුදු දහමේ උගන්වන ප්‍රධාන භාවනා ක්‍රම **දෙක** නම් කරන්න.
(ii) ඉන් එක් භාවනා ක්‍රමයක් සැකෙවින් හඳුන්වන්න.
(iii) ශිෂ්‍ය ජීවිතයේ සාර්ථකත්වය සඳහා භාවනාව උපයෝගී කරගත හැකි ආකාරය පහදන්න.

3. (i) "උට්ඨානවතෝ සතිමතෝ" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.
(ii) එම ගාථාවේ තේරුම ලියන්න.
(iii) පුද්ගල ජීවිතයේ සාර්ථකත්වය උදෙසා ධම්මපදයෙන් ලැබිය හැකි ආදර්ශ ඇගයීමට ලක් කරන්න.

4. (i) "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" යන පාඨයෙහි අදහස ලියන්න.
(ii) විපාක දෙන කාලය අනුව කර්මය බෙදා දක්වන ආකාර **හතර** ලියා දක්වන්න.
(iii) කර්මය හා කර්ම ඵලය පිළිබඳ අවබෝධය පුද්ගල හා සමාජ යහපත සඳහා ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න.

5. (i) අමාවතුර රචනා කළ කතුවරයා සහ ඊට පාදක වූ බුදුගුණය ලියා දක්වන්න.
(ii) පන්සිය පනස් ජාතක පොත් වහන්සේ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
(iii) ශ්‍රී ලාංකික ජන ජීවිතය සකස් කරගැනීමට සිංහල බෞද්ධ සාහිත්‍යයෙන් ලැබුණු පිටිවහල විස්තර කරන්න.

[හයවැනි පිටුව බලන්න.

**6.** (i) තෙවන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා හේතු වූ කරුණු **දෙකක්** නම් කරන්න.

(ii) එම සංගායනාව පැවැත්වීම සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළ මහරහතන් වහන්සේ, අනුග්‍රහය ලබා දුන් පාලකයා හා පැවැත්වූ ස්ථානය ලියා දක්වන්න.

(iii) එම සංගායනාවේ ප්‍රතිඵල ශාසන ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය පහදන්න.

**7.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

(i) වැලිවිට සරණංකර සංඝරාජ මාහිමි

(ii) ආරක්ඛ සම්පදා

(iii) සම්මා වාචා

(iv) වාහල්කඩ

***